# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023
2025 සැප්තැම්බර් / ඔක්තෝබර්

## මානවශාස්ත්‍ර පීඨය

## සිංහල

(නව නිර්දේශය)

සිංහල ගද්‍ය සාහිත්‍ය, නාට්‍ය හා සිනමාව - **SINH 28214**

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින්වත් තෝරාගෙන
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** | **කාලය : පැය 03 යි.**

---

## I කොටස

01. පහත සඳහන් ඡේදවල අදහස ලිහිල් බසින් ලියා කතුවරයා සතු අවස්ථා නිරූපණ කුසලතාව පිළිබඳ කෙටි ඇගයීමක් කරන්න.

අ) එකල්හි සිටිහුගේ පරිජනයෝ ''ස්වාමිය, ගෙඅඟණයේ සැඬොලෙක් හොත්තේය'' යි කීහ. ''කුමට හොත්තේ දෝ හො?යි ගොස් පිළිවිස බලා මේ මස්ස ඔහුට දී නඟා පියව''යි යවී යැ. ජනයෝ ගොස් ''මේ මස්ස ගෙණ නැඟී යා''යි කීහ. ''මම් මස්සක් නිසා හොත්තෙම් නො වෙමි. දිට්ඨමඞ්ගලිකාව නිසා හොත්තෙමි''යි කීය. ''ඇය කවර වරදැ?''යි කීහු. ''මා නිරපරාධයහට ඇය ගැත්තන් කළ දෑ නොදක්ව? ඈ ලද හොත්තැනින් නැඟෙමි. නො ලද, නො නැඟෙමි''යි කීය. සිටි එපවත් අසා දුවගේ දොස් බව් දැන එක් කහවණුවක් දී යවී ය. ''මම දැරිය කැමැත්තෙමි කහවණු නො කැමැත්තෙමි''යි කීය. සිටි දූ සිටිඳූ දූ ''අප සෙනෙහැති එක ම දූව. වංශය රක්නට නිසි අනෙක් දරුයෙක් ඇත්තේ නොවෙ''යි බියපත්ව ''යව. දරුවෙනි, නොපසස්නා යමෙක් ඔහු මැරුයේ වී නම්, ඇපි හැමදෙනමෝ නස්මහ. ඔහු රක්ව''යි වටා ඕහට රකවල් දෙවා හඹු දී යවූහ. හේ එයි දූ පිළිබෙව් කෙළේ. මෙනියායෙන් දවස් යත් යත් දෙපස්හි සත් සත් ගෙහි මිනිස්සු නැඟී ''ඇපි තොප නිසා සැඬොල් වන්නට නො හැක්කම්හ. අප නො නසව. දැරිය දී ඔහු හොත්තැනින් නඟා යව''යි කීහු. ඔහු ක්‍රමයෙන් සියයක් දී දහසක් දී ලක්‍ෂයක් දී යවූහ. හේ එයිද් පිළිබෙව් කෙළේ.

ආ) එක් බාල නමෙක් කරණ ලෙසින් ම සැක ඇති ව විමසනු නිසා වස් ගණන් විචාරා වස් ගණන් කියන්ට නැත. වැඩි මාලු කල මහණ වූම්හ'යි කී කල් හි 'හැයි නො හික්මුණු මාල්ලණුවෙනි, වයසින් වැඩි මාලු වුව ත් පැවිද්දෙන් තමන් බාල නියාව නොදන්නා නියා ද? වැඩි මාලු වහන්දෑ දුටු කල බිම හස්නෙක හුන ත් නැඟී සිටිනා ආකාර දක්වා අවසර ලදින් හුන මනා තැන සසර බැඳ රඳවන්නට හිඳවා ලූ කණුවක් සේ නැඟී නොසිට හිඳින්නේ ත් හැයි ද? විචාළ දෙයට බැණ නොනැඟෙන්ට යුක්තියකු ත් මේ බුදු සස්නෙහි ඇද්ද? සෙසු වහන්දෑ කරණ ලෙස තමන් ඇසට නො පෙනෙන නියා ද? උසින් මහතින් මහත් බව මුත් කට යුත්තෙන් මහත් නො වන්ට කාරණ කිම් දැ'යි සකාරණ කොට බොහෝ දෑ කී සේක. එ කල්හි ථුල්ලතිස්ස තෙරුන් වහන්සේ ගුණයක් නිසා සැබෑ ගුණයක් වී නම් උපදනා අභිමාන නැති හෙයින් රජ කුලයෙහි උපන් හෙයින් ජාති ය නිසා අභිමානයක් උපදවා තමන් හැම යන්නේ කවුරුන් ළඟට දැ'යි විචාරා බුදුන් ළඟට ය යි කී කල්හි එ සේ කල තමන් හැම මා ගේ තරම් නොදන්ට කාරණ කිම් ද, මම තමන් හැම දෙනා ගේ බුදුන්ට අවශ්‍ය යෙමි. තමන් හැම ගේ ත් අවශ්‍ය කමෙක් ඇද්ද? තමන් ගේ බුදුන් ගේ පිය රජ්ජුරුවෝ ත් අපගේ මෑණියෝ ත් දෙ බින්නෝ ය. අප ගේ තරම් නො දැන තමන් හැම අපට දෙඩූ සැටියට බුදුන් ගේ නෑ කම් සැබෑ වී නම් අද කියටි කියවම්'යි බුදුන් කුමක් වදාරණ බවත් නොදැන ම නියං සමයේ හඬන ආසක් මෙන් ගර්ජන කොට ගෙන හඬමින් වලපමින් බුදුන් කරා ගිය සේක.

02. පොළොන්නරු යුගයේ භාවිත බහුවිධ ගද්‍ය රීති පිළිබඳ සනිදර්ශනාත්මක සමාලෝචනයක් කරන්න.

03. සද්ධර්මරත්නාවලී කතා කලාව පිළිබඳ ඇගයීමක් කරන්න.

## II කොටස

04. සිංහල නවකතාව කාලීන දේශපාලන, ආර්ථික පරිවර්තන පසුබිම් කොටගෙන ප්‍රභවය වූ ආකාරය සාකච්ඡා කරන්න.

05. "බැද්දේගම නවකතාවෙහි සාර්ථකත්වයට තුඩුදුන් මූලික සාධක වන්නේ චරිත, සිද්ධි හා අවස්ථා නිරූපණයෙහිලා රචකයා දක්වන සාමර්ථ්‍යයයි." සනිදර්ශන ව විභාග කරන්න.

06. "කෙටිකතාවක් රසවිඳීම මගින් සංකීර්ණ මානව ජීවිතය පිළිබඳ අවබෝධයක් ලද හැකි ය." දියමන්ති මාලය ආශ්‍රයෙන් විමසන්න.

## III කොටස

07. "නාට්‍යෝචිත අවස්ථා නිර්මාණයෙහි ලා කාලිදාස සමතෙකි." ශාකුන්තලා නාට්‍යය ඇසුරෙන් විභාග කරන්න.

08. ඇරිස්ටොෆනීස්ගේ 'මැඩියෝ' නාට්‍යයෙහි සිද්ධි හා චරිත ආශ්‍රයෙන් කුළුගැන්වෙන හාස්‍ය අවස්ථා පරීක්ෂා කරන්න.

09. "චිත්‍රපටය ස්වාධීන කලාංගයක් වශයෙන් අභිවර්ධනය වූයේ සාහිත්‍යයෙන් ලද ආභාසයෙනි." මෙහි සත්‍යාසත්‍යතාව විමසන්න.

10. "කාලීන දේශපාලන දැක්මකින් යුක්ත ව සිනමාව හැසිර වූ සුසමාදර්ශී අධ්‍යක්ෂවරයෙකු ලෙස ධර්මසේන පතිරාජ හැඳින්විය හැකිය." පාරදිගේ සිනමා කෘතිය ඇසුරෙන් පරීක්ෂා කරන්න.

**********************************